# පහන් වැට



## සම්බුලා
### නිරාෂ ගුණසේකර

කුරුලු කූජන මිහිරේ
මනෝරම් වන තීරේ
පොකුණු ඇල් දිය පිසහැමූ
මඳනලේ පලා ගියෙහිද
පැලි පැලී දිය බැස්ස
රාජරෝවයාධිය...

රම්‍ය වල වැද සරන යාමේ
පලාඵල සුව ඉසිඹු අතරේ
කුසුම් රොනවුල් පුසුඹ මතුයේ
අතුරුදන් වූවෙහිද
උනු පැන් සිහිල් පැන් සාදමින්
දේවියක විදි සරතැස...

හැමදේටමත් වැඩියෙන්
කටු ඇන්න සියුම් වචනත්
ගියාවද අමතකව
ඉසතිබූ පැස බිම හොවා
බැස ඇවිත් දිය රැළිය ගැඹරේ
කිමිදෙනා මද සීතලේ...

අහවරව ස්නානය
ගොඩ ඇවිත් අඳිද්දී වල්කැල
දියව යන තුණුසපුව
දිහා බැලූණිද නිකමට...

අසා ඒබස් ඇතොවුරේ
සිදගනන් දිවනළඟනන් ගැන
දානවඬ හීනියට තෙපළුව
ඇවිලූණිද දෑසගරතක්
කෝළ මන්දස්මිතියක්
රකුසෙකුගේ මුවින් නැගුණාත්...

ගිය කල්හි ඉර අවරේ
වදිද්දී අරණට බළල් අඩියෙන්
වල්වැද්දෙකුගේ තියුණු දෑසින්
හුණුවැල්ලේ කඩා හෙලූ පත්මයක්ව
හේ උන්නා නොදුටුවෙහිද...

වහා නැගී රෝහිමි අස
හඬා දොඩා සපථනඟා
නිමාව දැක සත්‍යක්‍රියාව
ඉස්මුදුනේ නමා හෙලූ දිය කොතළෙන්
ඇඹුල් උලා සෝදා ලූ තඹ මලක්සෙ
නිෂ්ටාවට නිවාරණයි සිතූ නමුදු...

සැඟවී රාජ ඇසකින්
තැනින් තැන ශේෂවුණු
පිළියම් කළ නුහුණු
කුෂ්ටයක් දෙකක් තී දුටුවෙද...

## අකල් වැහි
### ජයන්ත නිමල් සිරි

කන්ද පා මුල ලන්ද එළිකර
පහල බැවුම් වංගුවේ
කොයි තරම් නම් පෙරුම් පුරලද
පුංචි මල් ගහ ඉන්දුවේ

හවස හෙවනට ගෙදර එනකොට
කම්සෙ හැඩි කළ පොඩි දුවේ
කරපු දඟ ගැන බැණුම් අහලයි
අම්ම ළඟ නින්දට ගියේ

හෙටක පිරිපත පිරුණු හිත යට
හීතලට නිදි වැල් එතෙන කොට
හීනෙකින් වගෙ කණට ඇහුනා
ඉහල කන්දේ බකමූණු හඬ

මහ පාන්දර මටත් නො දැනී
පුරුදු උණුහුම ගැන හොයන කොට
අනවසරයෙන් කන්ද අවුදින්
දුන්නෙ වැලමිටි පාර පපුවට

කන්ද පා මුල ලන්ද එළිකර
මමයි මල් ගහ ඉන්දුවේ
පස් කන්ද යට හීන් ඉකියක්
ඇහෙනවා මගෙ පොඩි දුවේ

BOONDI.LK

## රැවටීම
### අතුල විජේවික්‍රම

ගිණුම්කරණය මුලාකරණය
ලාභ මවලා තියනවා
ගේ ජනේලය සරසලා මෙන්
තිරවලින් කුණු වහනවා

අලෙවිකරණය විකල්කරණය
රවටනා හැටි දෙසනවා
ඇස් වසාලා රීරි බොන්නට
උපක්‍රම පෙලගසනවා

ආර්ථික විශ්ලේෂකරණය
වෙලඳපොලවල් මවනවා
මනඃකල්පිත න්‍යායන් වල
අතරමංවී තැවෙනවා

සංඛ්‍යානය විජ්ජමානය
ඇත්ත කණපිට කරනවා
හාමතේ දසදහක් මැරුණත්
ඬස්වයංපෝෂිතඬ කියනවා

අපේ පොඩි උන් ඇදුම් නැතුවම
අහස් යානා බලනවා
උපාධිය ගෙන එනතුරා අපි
පිඟන් අල්ලන් සිටිනවා

## ඔබ යකඩ තුරුපතක්
### තුෂාරි ප්‍රියංගිකා



නූස් කඳු පෙළින් පායා ඉරක් දිලි දිලී
පතන් බිම් පුරා විහිදන රශ්මි කඳ වෙළී
තණපතින් පවා ඉකියක් හැඬුමකට හැරී
මහපොළොව වගේ නොසැළී ඔබ ඉන්න හැටී

මතක ගිලිහෙනා තුරුවැල අතර පත් වැනී
අපි දන්නවාද ගහ කොළ මල් සුසුම්ළන හැටී
අත නෑර ප්‍රාණයේ අතැලි මොහොතකට ගැටී
තිසා වැව වුණත් හිත හිත අඬනවා ඇතී

උස් අහස පුරා ඉගිලෙන මුත් රන් කුරුලූ පැටී
උන් දෑස් අද්දරින් ඉහිරෙයි උණු කඳුළු කැටී
මේ පාන්දරින් ඇහැරෙන මල් පෙති අතර නැමී
සමුගන්න හදනවද පුදුමයි හිනැහෙනා හැටී

**පසු සටහන**
මොහොතකට පසු, ඒ යකඩ තුරුපත ගිලිහී වැටිණ.

## රතු හැඳි ගෙවිලිය
### සනත් බාලසූරිය



*"ගංගා කාවේරි දුම්රියේ දී ය"*

මිනිස් පුළුටක් නො සරණ
අඳුර වටළෑ තිරිඟු යායක
නිවී අළුවන රන්වන
හුදෙකලාව ම මේ ලෙස
දරාගන්නේ කොහොමද?

ඉරත් යන්නට ගිය පසු
අහස බොර පෑ සළු අඳින විට
සිය දහස් ගව් දුරින් එබෙනා
වැඩි උාජාරුවක් නැති කඳුගැට
දම් පාට අහසේ ම වළා සේ පෙනෙන විට
අහස පොළොවෙහි වෙනස නො දැනෙන
ඈත ඉමකට
පාව යන්නට නොසිතෙද?

ඉරක් * තරුවක් * සඳක් නොපැමිණි
අඳුරු බොල් කබොල්ලක් බඳු මහා අහසක් යට
මිනිස් වාසෙක ලකුණකුදු නැති
මහා තැනිතලාවක් මත

ඔබේ ලෝකය
හිතාගන්නට බැරි තරම්
සුවිසල්ද? ගැඹුරුද?

එසේ නැතිනම්
මට නො තේරෙන තරමට
පටුද? අඳුරුද? පාළුද?

ගත වසා දිදුලන
අඳුරු තිර වුව කීතුකරවන
රතු පැහැති සාළුව
සැඳෑ කල එකලාව සරනා
කවියකුට නිමිත්තක් පමණද?

***ගංගා කාවේරි සීඝ්‍රගාමී දුම්රිය සතියකට දෙ වතාවක් දකුණු ඉන්දියාවේ චෙන්නායි දුම්රිය ස්ථානයේ සිට බිහාරයේ චාප්රා බලා පැය 42ක් පුරා කිලෝ මීටර් 2343ක් දුර ගමණක යෙදෙයි. මෙම දුම්රියෙන් කිලෝ මීටර් 2138ක් දුර ගෙවා පැය 37 හමාරක් ගිය විට වරණාසි හෙවත් බරණැස වෙත ළඟාවිය හැකි ය.***

## ඕනෑ නම් නුවර යන්න කොට්ට උඩින් පැනල යන්න
### දසුන් වානගුරු



රෑ පානේ රේස් යන්න නුවර වීදි වෙන්කරන්න
බේබිලා ගේ ෆන් කඩන්න,එපා අනේ එරෙහිවෙන්න
රටක ඉදන් ආපු සුද්දෝ මල් වට්ටිය ගත්ත ඔන්න
මාලිගාව ලඟින් යද්දී නයිට් රේස් බලන් යන්න

මාලිගාවේ තේජස දැක දළදා හිමි පිහිට ගන්න
යුරෝපයෙන් සුදු ඇදගෙන ආපු ඈයො මේ අහන්න
මල් පුදලා තෙල් පුදලා දළදා හිමි වැදලා එන්න
යමින් ගමන් බීර බිබී නයිට් රේස් බලලා යන්න

මොනාරාගල ඉදන් ආපු නාකි නඩේ මේ අහන්න
දළදා හිමි වැන්දානම් ඉක්මනින්ම ගෙදර යන්න
නාකි නේද නුවර නැතේ කිසිවක් නුඹලට බලන්න
තව ටිකකින් නයිට් වෙනව බේබි ඒවි කොඩි වනන්න

"ඔලමොට්ටල මි හරකෝ" කාකි සුට් කියයි ඔන්න
ඔය කරත්ත,මල් සයිකල් පාරෙන් අහකට කරන්න
තව ටිකකින් කැන්ඩි ටවුන් සුරපුරයක් මෙන් දිලෙන්න
බාධාවක් තොපි හිටියොත් ඕවා අරන් ගෙදර යන්න

පාර දෙපස අඩි දහයේ පෙට්ටි වෙළඳසැල් වහන්න
ඕවා එක්ක බැහැ යකුනේ කැන්ඩියෙ රේසිං පදින්න
මේ දින තුන කඩේ වහල ගෙදර ඉදන් බුදිය ගන්න
කන්න බොන්න නැතුවත් ඇති අපි ඒවාට මක් කොරන්න

උදේ වරුවෙ ඕනෑ නම් දළදා හිමි වැඳල යන්න
පාර පුරා වැලි පුරවපු ගෝනි තියල ඇතිනෙ ඔන්න
සුදු ඇදගත් ඔය අම්මා නුවර ටවුන් පහු කරන්න
ඕනෑ නම් යන්න ඔන්න කොට්ට උඩින් පැනලා යන්න

## සාමණේර තෙරණුවෝ
### ප්‍රේමවංශ දසනායක
ඇල්ටෝනා, වික්ටෝරියා.



සූරිය මලක් සේ හිරු රැස් වැද දිලෙන
කහ පැහැ සිවුර ලෙලදේ උරහිස මතින
පිරිපුන් සිනා සඳ කැන් වපුරා වුවන
පොඩි හාමුදුරුවෝ වැඩමති තුටු සිතින

කෙළි ලොල් ළමා දිවියෙන් සමුගෙන පෙරදා
සසුනට කැපව ගුරු දෙගුරුන් සිත් පුබුදා
වන පොත් කරන්නට අභිධර්මය මතු දා
සෑදී පැහැදුනිද ඔබ ඉති සිතින් එදා

කාලය පියා සලමින් දින සති වසර
ආපසු නොබලමින් ඉගිලී යන අතර
වයසින් මුහුකුරා තාරුණ්‍යයෙ රුධිර
ගලනා දිනය සංවර වෙද ඔබ සිරුර

ළපටි වදන් තෙපලු සියුමැලි මුවින
ගැඹුරු බණ දහම් අටුවා ඇසෙන දින
පැසුණු බුද්ධියෙන් විවරණ දිවි ගමන
විපිළිසර කරයි දෝ ඔබ සිත් සතන

හිරිමල් කැකුලූ වන තුරු වදුලේ පිබිද
පිනි බිඳු මුව දොවා මඳ නල පහස විඳ
හිමිදිරි උදෑසන අරුණලූ සමග හිඳ
දළ හිරු රැසින් දහවල මැලැවී යයිද